# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1980 අංක 1 දරන
## විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 10 වන දින]

ඇණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි | තැපැල් ගාස්තුව : ශත 25 යි

**1980 අංක 1 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 75/79.

**1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1980 අංක 1 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිටවීමේ අවසර පත්‍ර පනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— **1971 අංක 53 දරන පනතේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

"විදේශ ගමන් බලපත්‍ර සහ හැදිසි සහතික වලංගු කාල සීමාව.

5. (1) විදේශ ගමන් බලපත්‍රයක් වලංගුව පවත්නා කාලය අවුරුදු පහක් නොඉක්මවන කාල සීමාවක් විය යුතු ය. නියම බලධරයා විසින් ඒ විදේශ ගමන් බලපත්‍රයේ වලංගු භාවය අවුරුදු පහක් නොඉක්මවන තවත් කාල සීමාවක් සඳහා කලින් කල අලුත් කළ හැකි ය. එසේ වුවද ඒ විදේශ ගමන් බලපත්‍රයේ සම්පූර්ණ වලංගු කාල සීමාව ඒ බලපත්‍රය නිකුත් කළ දින සිට අවුරුදු දහයක් නොඉක්ම විය යුතු ය.

(2) හදිසි සහතිකයක් වලංගුව පවත්නා කාලය අවුරුදු දෙකක් නොඉක්මවන කාල සීමාවක් විය යුතු ය. නියම බලධරයා විසින් ඒ හදිසි සහතිකයේ වලංගු භාවය, ඒ සහතිකය ඉකුත්වීමේ දින සිට අවුරුදු දෙකක් නොඉක්මවන තවත් කාල සීමාවක් සඳහා කලින් කල අලුත් කළ හැකි ය.

(3) නියම බලධරයා විසින් ඒ විදේශ ගමන් බලපත්‍රය හෝ හදිසි සහතිකය, වලංගුව පවත්නා කාලය හෝ ඒ විදේශ ගමන් බලපත්‍රයේ හෝ හදිසි සහතිකයේ වලංගු භාවය අලුත් කිරීම හෝ නියම කිරීමේ දී එක් එක් කාරණයේ අවශ්‍යතා සහ අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු ය.".

2—ඒ 47112—11,700 (80/01)

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විදේශ ගමන් බලපත්‍ර, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර සහ හදිසි සහතික නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා ගාස්තු.

9. (1) විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් එක්සියයක් විය යුතු අතර, එය අලුත් කිරීම සඳහා ගාස්තුව වර්ෂයකට රුපියල් විස්සක් විය යුතු ය.

(2) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් එක් සියයක් විය යුතු අතර, එය අලුත් කිරීම සඳහා ගාස්තුව වර්ෂයකට රුපියල් විස්සක් විය යුතු ය.

(3) හදිසි සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තුව රුපියල් විසිපහක් විය යුතු අතර, එය අලුත් කිරීම සඳහා ගාස්තුව වර්ෂයකට රුපියල් දහයක් විය යුතු ය.

(4) විදේශ ගමන් බලපත්‍රයක් වෙනස් කිරීම සඳහා ගාස්තුව රුපියල් විස්සක් විය යුතු ය.

(5) හදිසි සහතිකයක් වෙනස් කිරීම සඳහා ගාස්තුව රුපියල් දහයක් විය යුතු ය.".

සංශෝධන අතීතයට බලපෑම.

4. මේ පනතේ 2 වන සහ 3 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන 1979 නොවැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.